සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2023(2024) | 32 | S | II

ගණිතය | කාලය පැය දෙකයි මිනිත්තු තිහයි

## I (A) කොටස

- ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

01. පොල් ගෙඩි 6 ක මිල රුපියල් 630 ක් නම් පොල් ගෙඩි 5 ක මිල සොයන්න.


02. 25 ද්විමය සංඛ්‍යාවක් ලෙස ලියන්න.

03. $\frac{3}{2x} + \frac{2+x}{2x}$ සුළු කරන්න.

04. සාධක සොයන්න. $P^2 - 2P + 3P - 6$

05. $3.2023 \times 10^3$ සංඛ්‍යාව සාමාන්‍ය ආකාරයට පරිවර්තනය කරන්න.

06. රූපයේ දී ඇති දත්ත අනුව $x$ හි අගය සොයන්න.




07. ලීටර් 1.5 ක ධාරිතාවයකින් යුතු බෝතලයකින් ද්‍රව මිලි ලීටර් 850 ක් ඉවත් කළ පසු ඉතිරි ද්‍රව ප්‍රමාණය ඝන සෙන්ටිමීටර් කීයද?




Scanned with CamScanner

08. $\frac{x^2}{x^{-1}}$ සුළුකර පිළිතුර ධන දර්ශක සහිතව ලියන්න.

09. 1 සිට 6 තෙක් අංක යෙදූ සමබර ඝනාකාර දාදු කැටයක් උඩ දැමූ විට, උඩට පිහිටන අංකය 5 ට වැඩි සංඛ්‍යාවක් වීමේ සම්භාවිතාව සොයන්න.

10. $v=u+at$ සූත්‍රයේ $a$ උක්ත කරන්න.


11. $x-1>1$ අසමානතාව විසඳා , එහි නිශ්ලමය විසඳුම් පහත සංඛ්‍යා රේඛාව මත නිරූපණය කරන්න.




12. විසඳන්න. $\frac{x-3}{7}=2$

13. $x=2$ ද $y=\frac{1}{3}$ ද වන විට $2x-3y$ හි අගය සොයන්න.

14. තිරස් බිමක පිහිටි A,B,C ස්ථාන 3 ක පිහිටීම දී ඇති දළ සටහනේ දැක්වේ.
ඒ අනුව A සිට C හි දිගංශය සොයන්න.






Scanned with CamScanner

15. පාද n ගණනක් ඇති බහු අස්‍රයක බාහිර කෝණයක අගය සහ අභ්‍යන්තර කෝණයක අගය n ඇසුරින් ලියන්න.

i. බාහිර කෝණය

ii. අභ්‍යන්තර කෝණය

## I (B) කොටස

(01) a) $\left(1\frac{1}{4}-\frac{1}{2}\right)$ ත් $\frac{3}{7}$ සුළු කර පිළිතුර සරලම ආකාරයෙන් ලියන්න.

b) මිනිසෙක් තම ආදායමෙන් $\frac{1}{4}$ ක් ආහාරපාන සඳහා ද $\frac{1}{5}$ ක් ඇඳුම් පැලඳුම් සඳහා ද ඉතිරිය වෙනත් වියදම් සඳහා ද යොදාගනී.


i. ආහාරපාන සහ ඇඳුම් පැලඳුම් සඳහා වෙන් කළ මුදල මුළු ආදායමෙන් කවර භාගයක් ද ?

ii. වෙනත් වියදම් සඳහා ඉතිරි වූ මුදල මුළු ආදායමෙන් කවර භාගයක් ද?

iii. මිනිසාගේ මුළු ආදායම රුපියල් 88000 ක් නම්, වෙනත් වියදම් සඳහා යොදා ගත් මුදල සොයන්න.

(02) රූපයේ දැක්වෙන්නේ ABCD සමාන්තරාස්‍රාකාර කොටසක් හා අර්ධ වෘත්තාකාර කොටසකින් සමන්විත වූ ආස්තරයකි. ( $\pi = \frac{22}{7}$ ලෙස ගන්න )

දී ඇති මිනුම් අනුව,




i. අර්ධ වෘත්තයේ අරය සොයන්න.

ii. චාප කොටසේ දිග සොයන්න.

iii. ආස්තරයේ පරිමිතිය ගණනය කරන්න.

iv. සමාන්තරාස්‍ර කොටසේ වර්ගඵලය ගණනය කරන්න.

v. AD විෂ්කම්භය වන ලෙස තවත් අර්ධ වෘත්තාකාර කොටසක් ආස්තරයට එක් කරයි නම් මුළු ආස්තරයේ වර්ගඵලය සොයන්න.



Scanned with CamScanner

සියලුම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
Department of Education Central Province

09 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2023(2024) | 32 S II

## ගණිතය - II

- ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු සපයන්න.

(01) a. මේසයක නිෂ්පාදන වියදම රුපියල් 2000 කි. එහි විකුණුම් මිල රුපියල් 3500 කි.

i. විකිණීමේ දී ලැබෙන ලාභය කොපමණද?

ii. ලාභය නිෂ්පාදන වියදමේ ප්‍රතිශතයක් ලෙස දක්වන්න.

iii. නිෂ්පාදන වියදම රුපියල් 2000 ක් වූ මෙම මේසයේ නිෂ්පාදන දෝෂයක් නිසා, 20% ක අලාභයක් වන සේ විකිණීමට සිදුවේ නම් විකුණුම් මිල සොයන්න.

b. රුපියල් 45000 ක් ලෙස මිල ලකුණු කර ඇති විදුලි පංකාවක් සඳහා විකිණීමේ දී 6% ක වට්ටමක් ලබාදේ.

i. දෙනු ලබන වට්ටම් මුදල සොයන්න.

ii. විදුලි පංකාවේ විකුණුම් මිල සොයන්න.

(02) $y=2x+3$ ශ්‍රිතයේ ප්‍රස්තාරය ඇඳීමට සැකසූ අසම්පූර්ණ අගය වගුවක් පහත දක්වේ.

| $x$ | -3 | -2 | -1 | 0 | 1 | 2 | 3 |
|---|---|---|---|---|---|---|---|
| $y$ | -3 | ........ | 1 | 3 | ........ | 7 | 9 |

i. වගුවේ හිස්තැන් පුරවන්න.

ii. ඉහත ශ්‍රිතයේ ප්‍රස්තාරය අඳින්න.

iii. එම ඛණ්ඩාංක තලය මත $y=5$ රේඛාව අඳින්න.

iv. ශ්‍රිතය හා $y=5$ රේඛාව ඡේදනය වන ලක්ෂයේ ඛණ්ඩාංක ලියන්න.

v. ඉහත $y=2x+3$ සරල රේඛාවට සමාන්තර වූද අන්තඃඛණ්ඩය $+5$ වූ ද සරල රේඛාව එම ප්‍රස්ථාරයේ ම ඇඳ පෙන්වන්න.

(03) සාධාරණ පදය $Tn=24-5n$ වූ සංඛ්‍යා රටාවේ


i. මුල් පද තුන ලියන්න.

ii. 12 වන පදය සොයන්න.

iii. -5 මෙම සංඛ්‍යා රටාවේ පදයක් නොවන බව පෙන්වන්න.

iv. මෙම සංඛ්‍යා රටාවේ පළමු පදයේ සිට පදයක් හැර පදයක් ගත්විට ලැබෙන සංඛ්‍යා රටාවේ සාධාරණ පදය ලියන්න.

(04) a. ABC ත්‍රිකෝණයේ AB පාදය E තෙක් දික්කර ඇත.
AE ට සමාන්තර ලෙස CF ඇඳ ඇත.




i. ABC∆ යේ පාදයක් දික් කිරීමෙන් සෑදෙන බාහිර කෝණය නම් කරන්න.

ii. එම බාහිර කෝණයට අදාළව අභ්‍යන්තර සම්මුඛ කෝණ යුගලය නම් කරන්න.


iii. එම බාහිර කෝණය හා අභ්‍යන්තර සම්මුඛ කෝණ යුගලය අතර සම්බන්ධය ලියා දක්වන්න.




Scanned with CamScanner

16519

b. රූපයේ දී ඇති දත්ත අනුව $x$ හා $y$ හි අගය සොයන්න.





c. දී ඇති රූප සටහන ඇසුරින්




i. ඒකාකාර කෝණ යුගලයක්,
ii. අනුරූප කෝණ යුගලයක්,
iii. මිත්‍රකෝණ යුගලයක්,
නම් කරන්න.

(05) i. PQ = 8cm වන පරිදි රේඛා ඛණ්ඩයක් අඳින්න.
ii. P හි දී PQ ට ලම්බ රේඛාවක් නිර්මාණය කරන්න.
iii. PR = 6 cm වන පරිදි ලම්භ රේඛාව මත R ලක්ෂ්‍යය ලකුණු කර PQR ත්‍රිකෝණය සම්පූර්ණ කරන්න.
iv. PR හා PQ රේඛාවල ලම්භ සමච්ඡේදක නිර්මාණය කරන්න.
v. ලම්භ සමච්ඡේදක හමුවන ලක්ෂ්‍ය O ලෙස නම් කර O කේන්ද්‍රය ද OP අරය ද වන ලෙස ගෙන වෘත්තය අඳින්න. එහි අරය මැන ලියන්න.

(06) දී ඇති වෙන් රූපය ඇසුරින් පහත ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.




i. A කුලකය විස්තර කර ලියන්න.
ii. B යනු 20 ට අඩු 5 හේ ගුණාකාර කුලකය නම් එහි අවයව දී ඇති වෙන් රූපය පිටපත් කර ගෙන එහි දක්වන්න.
iii. ඒ අනුව පහත දක්වෙන කුලක අවයව සහිතව ලියා දක්වන්න.

a. $A \cap B$

b. $A'$

c. ε

(07) ගණිත පරීක්ෂණයක් සඳහා සිසුන් සමූහයක් ලබාගත් ලකුණු පිළිබඳ තොරතුරු පහත අසමූහිත සංඛ්‍යා ව්‍යාප්තියේ දක්වේ.

| ලකුණු | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 |
|---|---|---|---|---|---|---|---|---|
| සිසුන් ගණන | 1 | 2 | 4 | 9 | 5 | 4 | 3 | 2 |

i. මෙම සංඛ්‍යාත ව්‍යාප්තියේ පරාසය කොපමණද ?
ii. දත්තවල මාතය සොයන්න.
iii. දත්තවල මධ්‍යස්ථය සොයන්න.
iv. මෙම පරීක්ෂණයේ දී සිසුවෙකු ලබාගත් ලකුණුවල මධ්‍යනය ආසන්න පූර්ණ සංඛ්‍යාවට වටයා ලියන්න.



Scanned with CamScanner


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න